**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම - 2019/2020**
---------------------------------------------------------

සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.
---------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
---------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස 06 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළයෙළ කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

**2.1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12/ දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ,රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2019/2020 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 ජනවාරි 31 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2019/2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සැකසීම අවසන් වූ විගස පෙබරවාරි 15 වැනි දින වන විට ඉදිරිපත් කිරීමට කටයුතු සලසමි. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විෂය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(2)(උ) වගන්තිය. | 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගමක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටවිය යුතු වුවත්, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඉදිරි කටයුතු සැලසීමට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23.1(අ) වගන්තිය | සමාගමේ තොරතුරු නිලධරයන් වශයෙන් නිලධරයන් එක් අයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ අභියාචනා විභාග කිරීම සඳහා නම් කළ නිලධාරියෙකු පත්කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී ඒ අනුව අදාළ නිළධාරියෙකු කඩිනමින් පත් කිරීමට කළමනාකාර අධ්‍යක්ෂතුමා වෙත උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | | |
| | (i) 4.2.2 ඡේදය | සමාගමේ කාර්යසාධනය ඇගයීම සහ අවශ්‍ය පාලනයන් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළදී පිළිවෙළින් අවස්ථා දෙකකදී හා එක් අවස්ථාවකදී පමණක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා තිබුණි. | මේ වන විටත් අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මසකම පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | **(ii) 5.2.3** හා **4** ඡේදය | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | **(iii) 7.4.5** ඡේදය | ස්ථාවර වත්කම් සහ ගබඩා සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සහ විශේෂ සමීක්ෂණ මණ්ඩල පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් **2016** වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මේ වන විටත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර අතර, භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | **(iv) 9.2** හා **9.3.1** ඡේද | සමාගම සඳහා කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණු අතර බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | දැනටමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කරමින් පවතින අතර ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩල හා අමාත්‍යාංශ අනුමැතියට ලබාදීමට කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **2014** පෙබරවාරි **17** දිනැති අංක **01/2014** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | ව්‍යාපාර කටයුතු සඳහා කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිත සංයුක්ත සැලැස්මක් සහ ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් මේ වන විට සකසමින් පවතී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **3.4.3** (අ) (ආ)(ඇ) (ඈ) | නිතර භාවිතා කරනු ලබන අයිතමයන් මිලදී ගැනීම සඳහා වාර්ෂිකව යාවත්කාලීන කරන ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තු භාවිතා කළ යුතු වුවත් සමාගමේ පහළ ආපන ශාලාව සඳහා භාණ්ඩ මිලට ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ වන විට සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු කරගෙන යනු ලබන අතර, ඒ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.2.1** (අ) | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් සමාගම විසින් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම සඳහා ගණකාධිකාරීවරයකු පත්කර ගැනීම සඳහා 2013 වර්ෂයේ සිට කටයුතු කර නොතිබූ අතර සහකාර ගණකාධිකාරී තනතුරද 2019 ජුනි 03 දින සිට පුරප්පාඩුව පැවතුණි.මෙම තත්ත්වය අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට කාලීනව ඉදිරිපත් නොවීමටද හේතු වී තිබුණි. | 2022 වර්ෂයේ නව මූල්‍ය උපදේශකවරයෙකු බඳවා ගැනීමේ කටයුතු සිදු කරන ලදී. ඉදිරියේ දී කඩිනමින් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමේ ආපන ශාලාව මගින් ඉටුකරවාගත හැකිව තිබුණු ආහාර ඇණවුම් සමාගම විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව අවස්ථා 03 ක දී එකතුව රු 1,685,900 ක් වැය කර බාහිර ආයතනයක් මගින් සිදු කරගෙන තිබීමෙන් සමාගමට ලැබිය හැකිව තිබූ ලාභ ඉපයීමේ අවස්ථාව මගහැරී තිබුණි. | ලැබෙන ඇණවුම්වල ස්වභාවය අනුව අපගේ ආපනශාලාවේ අදාළ පහසුකම් සහ සේවා සැපයීම් නොමැති අවස්ථාවන් වලදී බාහිර සේවා සපයා ගත් අතර, වර්තමානයේ දී ද ඇණවුම් ලබා දෙන අයගේ ඉල්ලීම පරිදි බාහිර ආයතන මඟින් සේවා සැපයීම් සිදු කිරීම සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | ව්‍යාපාර කටයුතු ලාභ ලබන තත්ත්වයෙන් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජයීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම්කර ගනිමින් හඳුන්වාදුන් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය "2030 - හි තම විෂය පථය යටතට ගැනෙන තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි . | විශේෂ අවධානයක් යොමු කර ඊට අදාළව ඉදිරියේ දී කටයුතු සිදු කිරීමට උපදෙස් දෙන ලදී. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරණ චකුලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |